# Shehan Semasinghe

***600M, Airport Road, Anuradhapura, Sri Lanka***

සියලුම මාධ්‍ය ආයතන
ප්‍රවෘත්ති අධ්‍යක්ෂ /කර්තෘ/ සංස්කාරකවරු වෙත.

<u>මාධ්‍ය නිවේදනය</u>

පසුගිය සමයේ ගෝලීය වශයෙන් ආර්ථිකයේ පැවති තත්වයන් හමුවේ අපේ රට ද ආර්ථික වශයෙන් විවිධ බලපෑම්වලට ලක් විය. එසේ ම පැවති විවිධ රජයන් විසින් ගත් තින්දු හා තීරණ හේතුවෙන් රටේ ඇති වූ ආර්ථික, දේශපාලන අර්බුදයන් හා අරගල හමුවේ රට බංකොලොත් රටක් බවට පත් විය. ඒ බංකොලොත් ආර්ථිකය ගොඩ ගැනීමට කැප වී ක්‍රියා කිරීමට මට ද අවස්ථාව උදා විය.

රට බංකොලොත් වීමත් සමගම අපගේ ප්‍රමුඛ කාර්යය වූයේ බංකොලොත්භාවයෙන් රට ගොඩ ගැනීමේ වගකීම ඉටු කිරීමයි. ඒ සඳහා ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතා විසින් හවුල්කාර රටවල් හා බහුපාර්ශවීය මූල්‍ය ආයතන සමග සාකච්ඡා කිරිමේ වගකීම පැවරුවේ රාජ්‍ය මුදල් ඇමතිවරයා ලෙස මා වෙත ය.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදල හා ණය හිමියන් සමග සාකච්ඡා පවත්වමින් අර්බුදයෙන් රට ගොඩ ගැනිමේ භාරදූර කාර්යයට උර දෙමින් රට බංකොලොත්භාවයෙන් මුදා ගැනිමේ වගකීම ජනාධිපතිතුමාගේ නායකත්වයෙන් රට වෙනුවෙන් මා සාර්ථකව ඉටුකළ බව ඔබ දන්නා කරුණකි.

ආර්ථික ප්‍රතිසංස්කරණ හඳුන්වාදෙමින් ණය තිරසරබව ඇතිකිරීමට අත්‍යවශ්‍ය ද්විපාර්ශවික හා ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර හිමියන් සමග ණය ප්‍රතිව්‍යුහගතකරණ ක්‍රියාවලිය අවසන් කරමින් ළගාකරගත් ජයග්‍රහණය ගැන මම නිහතමානිව ආඩම්බර වෙමි.

රටේ ඇති වු ආර්ථික අර්බුදයට විසඳුම් සෙවීම ප්‍රධාන කාර්යයක් ලෙස ආණ්ඩුවක් හැටියට අප වෙත පැවරී තිබුණ රාජකාරි හේතුවෙන් පක්ෂ දේශපාලනය සිදු කිරිමට ප්‍රමාණවත් කාලයක් හා නිදහසක් නොලැබිණි. පාක්ෂිකයන් මග හැරුණ අතර පක්ෂ දේශපාලනය තුළ බලාපොරොත්තු වන දේවල් අපිට කිරිමට නොහැකි විය. මෙම අර්බුධය හමුවේ වුවද ජනතාව බලාපොරොත්තු වුණේ බඩු මිල අඩු කිරිම, බදු අඩු කිරිම, විදුලිය හා ඉන්ධන මිල අඩු කිරීම, වැටුප් වැඩි කිරිම, ගොවි ණය කපා හැරිම් , පොහොර සහනාධාරය හා රජයේ රැකි රක්ෂා යනාදී සහන ය. නමුත් රජයක් හැටියට අපිට ජනතාව බලාපොරොත්තු වුණ ජනප්‍රිය තීරණ ගන්න පුළුවන් වාතාවරණයක් පැවතියේ නැත. අප සැලසුම් කළේ බංකොලොත් භාවයෙන් රට මුදවා ගෙන අනාගත අභියෝගවලට මුහුණ දිය හැකි ආර්ථිකයක් ඇති කිරීමටයි. රට බංකොලොත්භාවයෙන් මුදා ගැනීමට අපට හැකි වූ අතර රටේ ස්ථාවරත්ව ඇති කර ආර්ථික වර්ධනයක් වෙත අනෙක් රටවල්වලට සාපේක්ෂව කෙටිම කාලයක් තුළ මෙහෙයවීමට ද හැකියාව ලැබිණි.

රට හා ආර්ථිකය ස්ථාවර වූ විට එහි ප්‍රතිලාභ ජනතාවට හිමි වන නිසා ජනතාව එය අවබෝධ කරගන්නට සමත් වනු ඇතැයි අපි විශ්වාස කළෙමු. ඒ හේතුවෙන් රට හදන සැලැස්ම ජනතාව අනුමත කරනු ඇති බව අපි අනුමාන කළෙමු.

නමුත් රටක් හැටියට මේ සිදු කළ කැපකිරීම් සහ අප ලද ජයග්‍රහනයන් ගැන ජනතාවට නිසි අවබෝධයක් නොතිබුණ බව මගේ විශ්වාසයයි. නොඑසේනම් ජනතාව තවදුරටත් පොරොන්දු දේශපාලනය පිළිබඳ විශ්වාසයක් තබා ගත්තා විය හැකි ය. අපේ රටේ ජනතාවගේ ආර්ථික හා දේශපාලන කියවීම වෙනස් එකක් බව ජනාධිපතිවරණ ප්‍රතිපලවලින් මනාව ඔප්පු විය. ජනතාව විශ්වාස කළේ ප්‍රතිපලය නොව පොරොන්දු දේශපාලනයයි. ජනකාන්තවාදී පොරොන්දුයි. ඔවුන් අපගේ සැලසුම් වැඩපිළිවෙළ ප්‍රතික්ෂේප කළහ. ඔවුන් තෝරා ගත්තේ අපිට ප්‍රතිවිරුද්ධ ජනකාන්තවාදී මාවතයි. අප මහත් පරිශ්‍රමයෙන් ගොඩනැගූ ප්‍රතිපත්ති ගරුක දේශපාලන මාවත ජනතාව ප්‍රතික්ෂේප කිරීම සම්බන්ධයෙන් මා හට ඇත්තේ විශාල කම්පනයක් සහ කලකිරීමකි.

එබැවින් එලැඹෙන මහ මැතිවරණයට මා ඉදිරිපත් නොවන බව දැනුම් දෙන්න කැමත්තෙමි. මම මැතිවරණයට ඉදිරිපත් නොවුණත් දේශපාලන කටයුතුවලින් ඉවත් නොවන බව ද, මා කෙරෙහි තැබූ විශ්වාසය මත පාර්ලිමේන්තුවට පත් කළ අනුරාධපුර ජනතාව වෙනුවෙන් ඉදිරියටත් සේවය කිරීමට කටයුතු කරන බව  ද දැනුම් දීමට කැමැති ය. බලය ලබා ගැනිමට මෙන්ම, බලය අත් හැරිමටද අපට හැකියාව තිබිය යුතු බව මාගේ විශ්වාසයයි. බලය තිබුණ කාලයේ අවංකව සේවය කිරීමට හැකියාව ලැබුණ නිසා බලය අත්හරින්න කිසිඳු දුකක් සංකාවක් මට නැත. ඉදිරියේ දී රටට අවශ්‍යවන ඕනෑ ම වෙලාවක මගේ සේවය ලබා දීමට නිරහංකාරව ඉදිරිපත් වීමට සූදානම් බවත් විශේෂයෙන් මතක් කළ යුතු ය.

ජනතාව විටෙක ඉල්ලා සිටියේ පාර්ලිමේන්තුවේ **225** ම පරාජය කර  අලුතින් **225** ක් ජයග්‍රහණය කරවීමයි. එය ඔබේ මතය විය හැකි නමුත් අප එක දෙයක් මතක තබාගත යුතු ය. ඒ නම්, මේ රට ගොඩගන්න හැකි සහ මේ වන විටත් ගොඩ නගා පෙන් වූ නිකැලැල් සේවයක් කළ, මහත්මා දේශපාලනය කළ සහ කරන යම් කොටසක් පාර්ලිමේන්තුවේ සිටි බවයි.

ශෙහාන් සේමසිංහ